**එයාපෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා ) ලිමිටඩ්- 2017**

---

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමෙහි ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6)ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මණ්ඩලයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

(අ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ඇතුළත් දේපළ පිරියත හා උපකරණ තුළ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලට අයත් ලියාහල අගය රු. බිලියන 24 ක් වූ වත්කම් ඇතුළත් කර තිබුණි. ආරම්භයේ සිටම එහි මෙහෙයුම් කටයුතු සීමා වී තිබූ අතර වර්තමානයේ එහි දේශීය ගුවන් යානා කිහිපයක් පමණක් හැරුනුවිට ජාත්‍යන්තර ගුවන් යානා මෙහෙයුම් කටයුතු සිදු නොකරයි.

මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි ආර්ථික කාර්යසාධනය මෙම වාර්තාවෙහි දිනය වන විට අයහපත් තත්වයකට පත්ව තිබූ අතර නුදුරු අනාගතයේදී ගුවන් තොටුපල නැවත ක්‍රියාකාරී තත්ත්වයට පත් කර වීමේ හැකියාවක් නොමැති වීම හේතුවෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 36, වත්කම් හානිකරණය අනුව මෙම කරුණ හානිකරන දර්ශකයක් ලෙස දැක්විය යුතු බවට මා සලකමි. කෙසේ වුවද වෙනම මූල්‍ය උත්පාදන ඒකකයක් (Separate Cash Generating Unit) යන පදනම මත රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි (MIRA) වත්කම් හානිකරණයක් පෙන්නුම් කරන්නේදැයි හඳුනා ගැනීම සඳහා කළමනාකරණය විසින් හානිකරණ පරීක්ෂාවක් සිදුකර නොතිබුණු අතර, ඒ අනුව 2017 දෙසැම්බර් 31 දිනට වත්කම් ලියා හැරීමක් සිදුකල යුතුද යන්න නිශ්චය කර නොතිබුණි. මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපලට අයත් දේපල පිරියත හා උපකරණවල (Recoverable) අගය තක්සේරු කිරීම සඳහා තොරතුරු නොමැතිවීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණවල ලියාහල අගය සම්බන්ධයෙන් මට සෑහීමකට පත්විය නොහැකි විය.

තවද මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 11(iii) කෙරෙහි අවධානය යොමු කරවමි. මේ සම්බන්ධයෙන් ඉන්දියානු රජය (GOI) සමඟ සාකච්ඡා පවත්වා තිබුණද ඉන්දියානු රජයේ යෝජනා මෙතෙක් අවසන් අදියරට පැමිණ නොතිබුණි.

(ආ) ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන (Voted Fund) සහ සමුච්චිත ආදායම් අරමුදල පදනම් කරගෙන සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පිළිබඳ පැහැදිලි කරන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් සටහන් අංක 2.1.1 කෙරෙහි මම අවධානය යොමු කරවමි. 2005 අගෝස්තු 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පදනම් කරගෙන භාණ්ඩාගාර ලේකම් විසින් එවා තිබූ 2006 පෙබරවාරි 04 දිනැති අංක පීඊ/ජීඕසීඕ/1/1 දරන ලිපිය මගින් පහත කොන්දේසි සම්පූර්ණ කිරීමට උපදෙස් ලබා දී තිබුණි.

i. රජයට අයත්වන ගුවන් තොටුපලේ ඇති ඉඩම් හා ගොඩනැගිලි සහ සමාගමට අයත් වෙනත් සංචලනය වන සහ සංචලනය නොවන වත්කම් අගය කිරීම සඳහා පියවර ගැනීම.
ii. වර්තමානයේ රජය මගින් සිදුකරනු ලබන ගුවන් තොටුපල සංවර්ධන කටයුතුවලට අදාල වගකීම් භාර ගැනීම.
iii. ශ්‍රී ලංකා රජය මගින් මාරු කරන ලද ශුද්ධ වත්කම් වෙනුවෙන් ශ්‍රී ලංකා රජය වෙත කොටස් නිකුත් කිරීම.

කෙසේ වුවද සමාගම විසින් වගකීම් පමණක් භාරගෙන තිබූ අතර රජයට අයත් ඉඩම් හා ගොඩනැගිලි සහ සංචලන වන හා නොවන වත්කම් අගය කර ගිණුම්වලට ගෙන නොතිබූ අතර ශුද්ධ වත්කම් වෙනුවෙන් රජයට කොටස් නිකුත් කර නොතිබුණි.

(ඇ) කටුනායක ගුවන් තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය, කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රජය විසින් ලබා ගන්නා ලද ණය සහ රත්මලාන ගුවන් යානා පාලන පද්ධතිය නවීකරණය කිරීම සඳහා ලබා ගන්නා ලද ණය මුදල් 2 ක් ඇතුලු රජය විසින් ලබා ගන්නා ලද විදේශීය ණය මුදල් විධිමත් ණය ගිවිසුම් නොමැතිව, භාණ්ඩාගාර ලේකම් විසින් 2006 පෙබරවාරි 04 දින නිකුත් කරන ලද ලිපියක් පදනම් කරගෙන සමාගමේ ගිණුම් පොත්වලට ඇතුළත් කර තිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට එම හිඟ ණය මුදල්වල එකතුව රු. මිලියන 10,139 ක් විය. මෙම ණය මුදල් ජනරජ ගිණුමේ වගකීමක් ලෙසද දැක්වීම නිසා ණය මුදල ද්විගණනය වී තිබුණු බව නිරීක්ෂණය විය.

තවද, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල (MRIA) සඳහා ලබාගන්නා ලද ණය මුදල් ද මහාභාණ්ඩාගාරය විසින් වලංගු ණය ගිවිසුමක් හෝ හුවමාරු ගිවිසුමකින් තොරව, අවබෝධතා ගිවිසුමක් (MOU) මත සමාගම වෙත මාරුකර තිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට එම හිඟ ණය මුදල රු. මිලියන 24,643 කට සමාන එ.ජ: ඩොලර් මිලියන 159 ක් විය.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම 1.4 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් ඇතිවන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින්, 2017 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 2.1.1 අනෙකුත් නීති හා නියාමන අවශ්‍යතා මත වාර්තාව

----------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා වන පදනම හා විෂය පථය සහ විගණනයේ සීමාවන් ඉහතින් ප්‍රකාශ කළ පරිදි වේ.

(ආ) මගේ මතය වනුයේ:

- විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ කරුණු මා විසින් ලබාගෙන ඇති අතර මාගේ පරීක්ෂණ වලින් පිළිබිඹු වන පරිදි, සමාගම විසින් විධිමත් ලෙස ගිණුම් වාර්තා තබා තිබුණි.
- සමාගමේ මූල්‍ය වාර්තා 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තිවල අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

------------------------------------

#### 2.2.1 ලැබිය යුතු ගිණුම්

------------------

සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු. 18,078,565 ක් වූ ලැබිය යුතු ශේෂ වර්ෂ දෙකකට වැඩි කාලයක සිට අයකර නොගෙන පැවතුනි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) 2010 අංක 14 දරන සිවිල් ඒවියේෂන් පනතේ 14 වගන්තිය | ගුවන්තොටුපල කලාප ස්ථාපනය හෝ සංවර්ධන සඳහා ප්‍රධාන සැලසුමක් සකස් කර හෝ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් අනුමැතිය ලබා ගැනීම 2017 දෙසැම්බර් 31 දක්වා සිදුකර නොතිබුණි. |
| (ආ) ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (අයිසීඒඕ) ප්‍රමිතීන් සහ 2015 වර්ෂයේ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් නිකුත් කරන ලද පරීක්ෂණ වාර්තාව | ආරක්ෂක සේවා ප්‍රධානියකු ස්ථිරව පත්කර ගෙන නොතිබුණි. තවද, ජාතික සිවිල් ගුවන් ආරක්ෂක වැඩසටහන අනුව, විශේෂිත ආරක්ෂක වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| i. 4.2.2. වගන්තිය | ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳ සහ ණය ගැනීම් ප්‍රකාශ, ප්‍රමාණාත්මක අගයන් සහිත මිලදී ගැනීම් සහ මානව සම්පත් පිළිබඳ ප්‍රකාශ ඇතුලත් මාසික මූල්‍ය ප්‍රකාශන සෑම මාසයකම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කල යුතු වුවත් එම ප්‍රකාශනයන් නියමිත පරිදි ඉදිරිපත් කර නොතිබුණි. |
| ii. 4.2.5. වගන්තිය | ණය ගැති, ණය හිමි සහ සෙමින් චලනය වන සහ යල්පැන ගිය තොග හඳුනා ගනිමින් තොග කාල විශ්ලේෂණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මාසිකව සමාලෝචනය කර නොතිබුණි. |
| iii. 5.1. වගන්තිය | සමාගම විසින් එහි අනාගත දිශාවන් නිශ්චය කරමින් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. |
| iv. 5.2.4. වගන්තිය | සමාගම විසින් මූල්‍ය වර්ෂය ආරම්භ වීමට මාස තුනකට පෙර එහි කෙටුම්පත් අයවැය ලේඛනය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| v. 7.2 හා 7.3 වගන්ති | මෙහෙයුම් අත්පොත් සංශෝධනය කර යාවත්කාලීන කර නොතිබූ අතර සමාගම විසින් මෙහෙයුම් අත්පොත් සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| vi. 7.4.5. වගන්තිය | සමාගමේ වත්කම් සත්‍යාපනය පිණිස සමාගම විසින් වාර්ෂික සහ විශේෂ භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. |
| vii. 9.2. (ඇ) වගන්තිය | සමාගමේ සංවිධාන ව්‍යුහය හා අනුමත කාර්ය මණ්ඩලය මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| viii. | 9.3.1. (i) වගන්තිය | සමාගමේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය (SOR) සඳහා අදාළ අමාත්‍යාංශයේ අනුමැතිය සහ මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගෙන නොතිබුණි. |
| ix. | 9.14 වගන්තිය | මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලි අත්පොත මණ්ඩලය විසින් අනුමත කර නොතිබූ අතර මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදී එහි සේවකයන් වෙනුවෙන් උපයන විට බදු හා බදු මත බදු ලෙස රු. 19,849,402 ක් ඔවුන්ගේ වැටුප්වලින් අඩු නොකර ගෙවා තිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සමාගමේ මෙහෙයුම් කටයුතු වලින් රුපියල් මිලියන 10,820 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර පසුගිය වර්ෂයේදී එම බදු පෙර ලාභ රු මිලියන 6,909 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 3,911 ක වර්ධනයක් සිදු වී තිබුණි. මෙහෙයුම් ආදායම වැඩිවීම හා ශුද්ධ මූල්‍ය ආදායම් පිලිවෙලින් රු. මිලියන 2,481 කින් හා රු. මිලියන 1,369 කින් වැඩිවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.1.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක් සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
|---|---|---|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය (වාර ගණන) | 2.78 | 2.65 | 2.09 | 1.68 | 1.29 |
| ක්ෂණික වත්කම් අනුපාතය (වාර ගණන) | 2.71 | 2.60 | 2.06 | 1.65 | 1.23 |
| ශුද්ධ ලාභ අනුපාතය (%) | 52 | 38 | 15 | 40 | 39 |
| කොටසක ඉපයීම (රු) | 43,574 | 34,598 | 4,084 | 17,058 | 17,768 |
| ශුද්ධ වත්කම් වලට ප්‍රතිලාභය (%) | 37 | 42 | 7 | 32 | 48 |
| එක් මගියෙකුට ආදායම (රු) | 2,085 | 1,938 | 1,846 | 1,785 | 1,652 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කෙටි කාලීන බැංකු තැන්පතු සියයට 146 කින් වැඩිවීම, ජංගම වත්කම් හා ක්ෂණික වත්කම් අනුපාතයන්ගේ වැඩිවීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

(ආ) ආදායමේ සියයට 14 ක වැඩිවීම හා මූල්‍ය ආදායම් සියයට 47 වැඩිවීම සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය සියයට 4 කින් වැඩිවීමට හේතු වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් කොටසක ඉපයීමද සියයට 26 කින් වැඩිවී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

------------------

(අ) 2013 සිට පසුගිය වර්ෂ 5 ක් සඳහා සමාගමේ භෞතික කාර්ය සාධනය සමාගමේ සංයුක්ත සැලැස්මේ සඳහන් කාර්යසාධන දර්ශකය හා සසඳා පහත දැක්වේ.

| කාර්යසාධන දර්ශකය | සත්‍ය සාධනය | | | | |
|---|---|---|---|---|---|
| | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
| ජාත්‍යන්තර ගුවන්යානා සංචලන සංඛ්‍යාව | 62,850 | 61,637 | 56,156 | 54,960 | 51,972 |
| ගුවන් මගීන් සංචලනයන් සංඛ්‍යාව | 9,957,502 | 9,466,248 | 8,505,740 | 7,780,724 | 7,330,421 |
| මගී සංක්‍රමණ සංඛ්‍යාව | 1,501,679 | 1,285,756 | 1,227,451 | 1,273,037 | 1,370,266 |
| මගී සංක්‍රමණ සංඛ්‍යාව මුළු මගී සංඛ්‍යාවේ අනුපාතය | 1:6.6 | 1:7.4 | 1:6.9 | 1:6.1 | 1:5.3 |
| නැව්බඩු සංචලනයන් (මෙට්‍රික් ටොන්) | 274,044 | 248,347 | 220,422 | 209,607 | 194,020 |
| එක් ගුවන් ගමනකට මුළු මෙහෙයුම් පිරිවැය (රු. 000) | 202 | 216 | 256 | 171 | 177 |

සමාගම විසින් ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන් සඳහා වාර්ෂික ඉලක්ක දක්වා නොතිබුණි. මේ නිසා අපේක්ෂිත කාර්ය සාධනයට එරෙහිව සත්‍ය කාර්ය සාධනය සැසඳීමට විගණනයේදී නොහැකි විය.

## 4.2 කළමණාකරන ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ තීරණයකට අනුව රු. 75,190,191 ක වටිනාකමින් යුත් ගොඩනැගිල්ලක්, 2017 මැයි 31 දින හෝටලයක් ඉදිකිරීම සඳහා කඩා ඉවත් කර තිබුණි. කෙසේ වුවද ගොඩනැගිල්ල ඉවත් කිරීමෙන් සමාගමට රු. 5,800,000 ක් පමණක් උපලබ්ධි වී තිබුණි. මේ නිසා සමාගමට රු. 69,390,191 ක විශාල අලාභයක් සිදු වී තිබුණි.

(ආ) ආයතනික සම්පත් සැලසුම් පද්ධතිය (ERP) ක්‍රියාත්මක කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව මාස 08 කින් නිමකිරීමට 2012 ජුනි 29 දින රු. මිලියන 248.6 කට පෞද්ගලික සමාගමකට පිරිනමා තිබුණි. සමාගම අදාළ කොන්ත්‍රාත්කරුට රු. මිලියන 27 ක් ගෙවා තිබූ අතර 2016 ඔක්තෝබර් 31 දක්වා අවස්ථා 4 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්තුව පිරිනමා වර්ෂ 4 ක් ගතවී තිබුණ ද, 2016 ඔක්තෝබර් 31 දින වන විටත් කොන්ත්‍රාත්කරු අදාළ කොන්ත්‍රාත්තුව නිමකර නොතිබුණි. එබැවින්, 2017 ජනවාරි 03 දින රු. මිලියන 24.86 ක්වූ කාර්යසාධන සුරැකුම මුදල් කරගෙන තිබුණි. මේ අනුව සමාගමට සිදුවූ අලාභය රු. මිලියන 2.6 ක් වී තිබුණි. තවද කොන්ත්‍රාත්කරු එම කාර්යසාධන සුරැකුම නැවත අයකර ගැනීම උදෙසා නඩුවක් ගොනුකර තිබුණි.

(ඇ) සංචාරක නිවාසයක් ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේදී රු. මිලියන 7 ක් වියදම් කර පෞද්ගලික පාර්ශ්වයකින් ඉඩමක් මිලදී ගෙන තිබුණි. ඉන්පසු මෙම ඉඩම රජයට අයත් ඉඩමක් බව කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දැනුම් දී තිබුණු අතර පසුව එම ඉඩම අවුරුදු 30 ක බදු පදනම මත සමාගමට ලබා දී තිබුණි. එසේම, මේ සම්බන්ධයෙන් එම පෞද්ගලික පාර්ශවයට විරුද්ධව සමාගම විසින් නඩුවක් ගොනුකර තිබුණි.

(ඈ) තොරතුරු තාක්ෂණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ඉහල අවදානමක් නිරීක්ෂණය වූ අතර පද්ධතිය සඳහා නිරන්තර සංශෝධනයන් අවශ්‍ය වීම නිසා සහ පද්ධතියේ අදාළ මොඩියුල සමඟ සම්බන්ධිත පද්ධති අතර සම්බන්ධතාවයක් නොමැති වීම නිසා පද්ධතිය ක්‍රියාත්මක කිරීම සැකසහිත විය.

(ඉ) 2013 දෙසැම්බර් 04 දිනැති අංක 050/2013 දරන ප්‍රතිපත්තිමය තීරණය මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රක්ෂණ ප්‍රතිපත්තිය වෙනුවට ආයතනයේ කළමනාකරණය යටතේ පවත්වාගෙන යන විශේෂ අරමුදලක් හඳුන්වා දීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 දින දක්වා සමාගම විසින් එබඳු අරමුදලක් ගොඩ නැගීමට පියවර ගෙන නොතිබුණි.

(ඊ) 2017 දෙසැම්බර් 31 දින වන විට පිරිවැය රු. 13,262,977,618 ක් වූ දේපල පිරියත හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණි. මේ අතරින් රු. 2,534,638,577 ක් පිරිවැය වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර වර්ෂ 20 කට වැඩියෙන් ගත වී තිබුණි. කෙසේ වුවද, භාවිතා කල හැකි වත්කම් ප්‍රත්‍යාගණනයට හා භාවිතා කල නොහැකි වත්කම් ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

## 4.3 නොවිසඳු විගණන කරුණු

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගම විසින් 2011 වර්ෂයේදී ස්වේච්ඡාවෙන් සේවයෙන් ඉල්ලා අස්වූ සේවකයෙකුට 2012 වර්ෂයේදී රු. මිලියන 2.5 ක් වන්දි ලෙස ගෙවා තිබුණි.

(ආ) 2006 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතියකට අදාලව 2007 හා 2008 වර්ෂ වලදී රේගු ගාස්තු ප්‍රතිපූර්ණය ලෙස රු. මිලියන 8.7 ක් ගෙවා තිබුණි. ව්‍යාපෘතිය යටතේ අමතර වැඩ සිදුකර තිබූ නමුත් අදාළ ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොවුනි.

(ඇ) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සංවර්ධන ව්‍යාපෘතියේ පළමු අදියරේ පළමු පියවර අවසන් වීමෙන් පසු අමතර ගිවිසුම් යටතේ එකතු කල අගය මත බදු ලෙස රු. මිලියන 92 ක් ගෙවා තිබුණි. තවද අනුමත නොකරන ලද අමතර ඇස්තමේන්තු මත රු. මිලියන 150 ක ගෙවීමක් කර තිබුණි.

## 4.4 මානව සම්පත් කළමණාකරනය

-------------------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1997 ඔක්තෝබර් 24 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අංක 124 දරන චක්‍රලේඛය ප්‍රකාරව පුරප්පාඩු වූ තනතුරක වැඩ බැලීමේ කාලය මාස 03 කට සීමා විය යුතු වේ. කෙසේ වුවද අංශ ප්‍රධානි තනතුරු වල වැඩ බැලීමේ කාර්යය සඳහා වර්ෂ 01 සිට වර්ෂ 05 ක් දක්වා කාලයක් නියෝජ්‍ය අංශ ප්‍රධානින් 4 දෙනෙකු පත්කර තිබුණි.

## 4.5 පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු සමාගමේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) මානව සම්පත් කළමනාකරණය | අනුමත සේවක සංඛ්‍යාවක් හා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් නොමැතිවීම. |
| (ආ) ගිණුම්කරණය | සමාගමේ සමස්ත විස්තරාත්මක ගිණුම්කරණ පද්ධතියක් නොතිබීම. |
| (ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල් | ගිණුම්වල දිගු කාලීන හිඟ ශේෂයන් පැහැදිලි කර ගැනීමෙන් හෝ/සහ නිරවුල් කිරීමෙන් තොරව පැවතීම. |
| (ඈ) වත්කම් කළමනාකරණය | i. භාණ්ඩ සමීක්ෂණය සිදුකිරීම සඳහා අවධානය යොමු කළ යුතු වීම.<br>ii. වත්කම් කේත නොකිරීම සහ වත්කම් ලේඛනය නිසි පරිදි පවත්වා නොතිබීම. |
| (ඉ) තොරතුරු තාක්ෂණ පද්ධති පාලනය | වර්තමාන වැඩ පරිසරයට අවශ්‍ය වන හොඳින් සැලසුම්කරන ලද පරිගණක ගත මූල්‍ය පද්ධතියක් නොමැති වීම. |